# අපි ලක්වැසියෝ.

## පාඩම් අංක 02.

01. පහත ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු ලියන්න.

1. අපට ආවේණික අපේ උරුමයන් දෙකක් ලියන්න.
2. නිදහස් සටනේ දී ජීවිතය පූජා කළ ජාතික විරුවන් දෙදෙනෙකුගේ නම් ලියන්න.
3. අපේ අතීත උරුමයන් සහිත ඓතිහාසික ස්ථාන ආරක්ෂා කිරීමට වගකීම භාරව ඇති දෙපාර්තමේන්තුව කුමක් ද?
4. ඓතිහාසික නටඹුන් දැකිය හැකි ලංකාවේ දැකිය හැකි ප්‍රධාන රාජධානි දෙක කුමක් ද?
5. අපට ආවේණික අපේ උරුමයක් සේ සැළකෙන ත්‍රිපිටකය බෙදෙන ප්‍රධාන කොටස් තුන කුමක් ද?
6. ඓතිහාසික සීගිරිය කුමන කලාවක් හා සම්බන්ධයෙන් ප්‍රසිද්ධියක් උසුලයි ද?
7. සීගිරිය රාජධානිය ගොඩනැගීමේ ගෞරවය හිමිවන්නේ කාටද?
8. අතීත ලාංකිකයන්ට ආවේණිකව තිබූ සටන් ක්‍රමය කුමක් ද?
9. අනුරාධපුර ප්‍රදේශයේ දැකිය හැකි දේශීය ගල්කැටයම් වලට අදාළ ප්‍රධාන නිර්මාණ 3ක් ලියන්න.
10. ජාතික උරුමයන් මෙන්ම ලෝක උරුමයන් ලෙස ද ගතහැකි ලංකාවේ දැකිය හැකි ස්ථාන 4ක් ලියන්න.
11. අපේ රටේ වාසය කරන ප්‍රධාන ජන කොටස් නම් කරන්න.
12. ගොංගාලේ ගොඩබණ්ඩා විරුවා හැඳින් වූ වෙනත් නම් දෙකක් ලියන්න.
13. මොනරවිල කැප්පෙටිපොල දිසාවට සිය පියාගේ ඇවෑමෙන් ලැබුණු තනතුර කුමක් ද?
14. "යුද්ධෙටත් ඇවිත් සිඳුපිට නැව් නැගලා" යන සටන් කවිය තුළින් කියවෙන්නේ කුමන විදේශීය ජාතියක පැමිණීම ගැනද?
15. ලංකාව යටත් කරගත් ජාතීන් තුන පිළිවෙළින් ලියන්න.
16. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කෙරෙන කාර්යයන් 2ක් ලියන්න.

02. දෙපස ඇති යෙදුම්වල සම්බන්ධතා හඳුනා ගනිමින් මුල්වචන පෙළේ ඇති අක්ෂර දෙවන වචන පෙළට අදාළ වරහන් තුළ යොදන්න.

| | | |
|---|---|---|
| **A.** ලංකාවේ පළමු රාජධානිය. | ( ) | ජල සම්පාදන මණ්ඩලය. |
| **B.** තැපැල් කාර්යාලයෙන් වන සේවයකි. | ( ) | වැදි ජනයාගේ ශාන්ති කර්මයකි. |
| **C.** ගොංගාලේ ගොඩබණ්ඩා. | ( ) | සිංහලයාගේ ප්‍රධාන ආහාර වේ. |
| **D.** වාරියපොළ සුමංගල හිමි. | ( ) | වෙසක් කූඩු. |
| **E.** නොමඳින් විකුම්පාලා-සැදෙමින් යුදට ජය. | ( ) | සංගීත ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකි. |
| **F.** ප්‍රදේශයේ ආරක්ෂාව ගැන සොයා බලයි. | ( ) | සිංහරාජ වනාන්තරය. |
| **G.** අපතේ යන දේ ඇසුරින් සෑදිය හැකි දෙයකි. | ( ) | දොන් පුල්ලේ වෙදරාල. |
| **H.** ප්‍රදේශයේ ජල අවශ්‍යතා සපයා දේ. | ( ) | අනුරාධපුර. |
| **I.** රටේ නිදහස දිනාදීම වෙනුවෙන් කැපවිය. | ( ) | අම්බලන්ගොඩ. |
| **J.** කිරි කොරහ යාගය. | ( ) | මුද්දර නිකුත් කිරීම. |
| **K.** බත් හා කිරිබත්. | ( ) | සුසන්තිකා ජයසිංහ. |
| **L.** අපේ ලෝක උරුමයකි. | ( ) | ඩී.එස්. සේනානායක. |
| **M.** රූකඩවල ප්‍රසිද්ධ ප්‍රදේශයකි. | ( ) | පොලීසිය |
| **N.** පණ්ඩිත් ඩබ්.ඩී. අමරදේවයන්. | ( ) | ලන්දේසි සම්බන්ධ හටන් කවියකි. |
| **O.** ක්‍රීඩාවෙන් ජාත්‍යන්තරය ජයගත් ක්‍රීඩිකාවකි. | ( ) | ඉංග්‍රීසින්ගේ කොඩිය බිමදමා පෑගීම. |

03. පහත ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරන්න.

1. දීපවාලී, තෛපොංගල් යන උත්සව සමරන්නේ,

   **(I)** හින්දු ආගම **(II)** ඉස්ලාම් ආගම **(III)** කතෝලික ආගම

2. සියලු ජාතීන් පොදුවේ සමරන උත්සවයකි.

   **(I)** වෙසක් උත්සවය **(II)** නිදහස් උත්සවය **(III)** පාස්කු උත්සවය

3. අඩ සඳ හා තරුව ආගමික සංකේතය වන ආගම වේ.

   **(I)** බෞද්ධ **(II)** හින්දු **(III)** ඉස්ලාම්

4. ඉස්ලාම් භක්තිකයන්ගේ ආගමික ස්ථානය වන්නේ,

   **(I)** පල්ලිය **(II)** කෝවිල **(III)** මස්ජිදය

5. ක්‍රීඩා අංශය සම්බන්ධයෙන් ලෝක ප්‍රසිද්ධ ක්‍රීඩකයෙකි.

   **(I)** සරත් ගුණපාල මහතා **(II)** සනත් ජයසූරිය මහතා
   **(III)** සුනිල් එදිරිසිංහ මහතා

6. අම්බලන්ගොඩ ප්‍රදේශය ප්‍රසිද්ධ වන්නේ,

(I) ලී කැටයම් වලට (II) රූකඩවලට (III) කොරල්පර වලට

7. "බයිබලය" ආගමික ග්‍රන්ථය වන්නේ කුමන ආගමේ ද?

(I) ඉස්ලාම් (II) කතෝලික (III) හින්දු

8. අපේ ජාතික ගීය නිර්මාණය කළේ කවුද?

(I) ආනන්ද කුමාරස්වාමි (II) ආනන්ද රාජකරුණා (III) ආනන්ද සමරකෝන්

9. ජාතික කොඩිය හා රාජ්‍ය ලාංඡනය යන දෙකෙහිම දැකිය හැකි සංකේතය කුමක් ද?

(I) ඉර හා හඳ (II) කඩුව අතින් ගත් සිංහයා (III) පුන්කලස

10. අපේ ජාතික ක්‍රීඩාව වන්නේ,

(I) නෙට්බෝල් (II) වොලිබෝල් (III) ක්‍රිකට්

11. ශ්‍රී ලාංකිකයන් නිදහස සමරනු ලබන්නේ,

(I) මාර්තු 4 (II) පෙබරවාරි 4 (III) අප්‍රේල් 1

12. ඉංග්‍රීසින් ලංකාව සම්පූර්ණයෙන් යටත් කරගනු ලැබුවේ.

(I) 1915 (II) 1815 (III) 1848

13. "ශ්‍රී වික්‍රම සර්වසිද්ධි" ලෙසින් තුන් සිංහලයට ම රජවූයේ,

(I) ටිකිරි කුමරු (II) පුරන්අප්පු (III) ගොංගාලේ ගොඩබණ්ඩා

14. ජාතික කොඩියේ දමිළ මුස්ලිම් ඇතුළු අනෙකුත් ජාතීන් නිරූපණය කිරීමට යොදා ඇති සංකේතය වන්නේ,

(I) රතුපැහැති පසුබිම (II) තැඹිලි හා කොළපාට තීරු (III) කහපාට තීරුව

15. කලාව හා සංස්කෘතික උරුමයන් විනාශ වීමට බලපා ඇති හේතුවකි.

(I) සංරක්ෂණය කිරීම (II) නොසලකා හැරීම (III) නැරඹීම

16. අතීතයේ අපේ රටට විශාල කීර්තියක් ගෙන ඒමට හේතු වූ දෙයක් නොවේ.

(I) කෙම් ක්‍රම හා හෙළ වෙදකම (II) විවිධ කැටයම් වර්ග

(III) ධීවර කර්මාන්තය

17. ප්‍රධාන ආහාරය ලෙස බුරියානි වැනි ආහාර භාවිතා කරන ජන කොටස වන්නේ,

(I) බර්ගර් (II) දෙමළ (III) මුස්ලිම්

18. ඉස්ලාම් ආගමිකයින් සමරන උත්සවයකි.

(I) නත්තල් (II) තෛපොංගල් (III) මීලාද් උත්සවය

19. "අස්සලාමු අලෛකුම්" ලෙස ආමන්ත්‍රණය කරමින් කතාබහ කරන්නේ,

(I) දෙමළ අය (II) බර්ගර් අය (III) මුස්ලිම් අය

20. 1848 විමුක්ති සටන සංවිධානය කළ වීරයකු වූයේ,

(I) ඩී.එස්. සේනානායක මහතා (II) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

(III) ගොංගාලේ ගොඩබණ්ඩා

21. ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු සම්බන්ධයෙන් ජනතාවට උපදෙස් දෙන්නේ,

(I) ග්‍රාම නිලධාරී (II) සමෘද්ධි නිලධාරී (III) කෘෂිකර්ම උපදේශක

22. තම ප්‍රදේශයේ පරිසරය පිරිසිදු කිරීම හා කුණුකසල නිසි අයුරින් බැහැර කිරීම සම්බන්ධයෙන් වගකීම ඇති ආයතනය වන්නේ,

(I) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (II) නගර සභාව (III) පොලීසිය

23. බට්ටා පැනීමේ ක්‍රීඩාවේදී භාවිතා කරන කොටු ගණන වන්නේ,

(I) 6 කි. (II) 7 කි. (III) 8 කි.

24. බිළිඳු දරුවන්ගේ හා ගර්භනී මව්වරුන්ගේ සෞඛ්‍යය හා පෝෂණ ගැටලු පිළිබඳ සොයා බලා උපදෙස් දීම කරන්නේ,

(I) සමෘද්ධි නිලධාරී (II) පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී (III) ග්‍රාම නිලධාරි

25. අපට සේවා සපයන රජයේ ආයතනයකි.

(I) සුපිරි වෙළඳසැල (II) විදුලිබල මණ්ඩලය (III) ආර්පිකෝ ආයතනය

ප්‍රදීප් කුමාර

කෑ/මාව/ අශෝක ප්‍රා.වි.

මාවනැල්ල අධ්‍යාපන කලාපය